**www.wsws.org** **ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# උදම් රැල්ල ශ්‍රී ලංකාව සිසාරා මරනය සහ විනාශය ගෙන එයි

## Tidal wave brings death and destruction throughout Sri Lanka

**අපේ වාර්තා කරුවන් විසිනි**
**2004 දෙසැම්බර් 28**

ඉරිදා උදයේ කිසිදු අනතුරු ඇඟවීමකින් තොරව ශ්‍රී ලංකාවට කඩා වැදුන උදම් රැල්ල දිවයින සිසාරා විනාශයේ දෝමනස්සයේ සහ මරනයේ රේඛාවක් ඇඳ තබා තිබේ. බරපතල ලෙස හානියට පත් සමහර ප්‍රදේශ පිලිබඳව කිසිදු නිශ්චිත වාර්තාවක් නැති අතර අලුත්ම නිල මරන සංඛ්‍යාව 12,000 ඉක්මවයි. දිවි ගැලවීමේ සහ සහන සැපයීමේ නිරත කම්කරුවෝ තව මත් සුන්බුන් අතර මෘතදේහ සොයති. ප්‍රවාහනයට සහ සංනිවේදනයට බරපතලව හානි සිදු වී ඇත. සුනාමි මුහුදු රැල්ල ශ්‍රී ලංකාවේ දකුනු ප්‍රදේශවලට මෙන් ම සමස්ත උතුරු නැගෙනහිර වෙරල තීරයට ද කඩා වැදුනේ ය. නිවාස මංමාවත්, ව්‍යාපාර, පාලම් සහ සංනිවේදන ජාල එක්කෝ හානියට පත් වීය නැත හොත් විනාශ වීය. නිල තක්සේරු කිරීම්වලට අනුව දශ ලක්ෂයක් ජනයා, හෙවත් සමස්ත ජනගහනයෙන් සියයට 5ක් ආපදාවට ලක් විය. බොහෝ දෙනා තමන්ගේ ප්‍රියයයන්, නිවාස සහ සන්තකයේ තිබුන දේ අහිමි වී අසරන බවට පත්ව සිටිති.

වඩාත්ම හානියට පත් ප්‍රදේශ තිබෙන්නේ විසි වසරක විනාශකාරී සිවිල් යුද්ධයෙන් බැට කෑ උතුර සහ නැගෙනහිර ය.

නොයෙක් දිස්ත්‍රික්කයන් පිලිබඳව ශ්‍රී ලංකා මිලිටරිය සැපයූ කරුනු අනුව මරන සංඛ්‍යාව: අම්පාර 2,183 : ත්‍රිකුනාමලය 586 : යාපනය සහ කිලිනොච්චි 3,700කි. නියම සංඛ්‍යා මීට වඩා ඉහල විය යුතු ය. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) පාලිත ප්‍රදේශවල මරන පිලිබඳව සංඛ්‍යා ලේඛන එතෙක් තක්සේරු කරන ලද ඒවා බව නිලධාරීහු පිලිගත්හ.

සියැසින් දුටු අයගේ ගනන් මිමි වලට අනුව දකුනේ දිස්ත්‍රික්කවල - ගාල්ලේ 650 සහ මාතර 389ක් වසයෙන් වන - නිල සංඛ්‍යා අඩු තක්සේරුවක් බව පැහැදිලි වෙයි. මාතර ඉරිදා පොලක සිටි සිය ගනනක් මුහුදට ගසාගෙන ගොස් තිබෙන අතර ගාල්ලේ බස් නැවතුම්පොල මුහුදු රැල්ලට හසුව මුලුමනින්ම ගසාගෙන ගොස් තිබේ. සුලි නැගුන ජලයේ දිවි බේරා ගැනීමට සටන් කරන දහස් ගනන් මිනිසුන්ගේ පැහැදිලි පින්තූර රූපවාහිනී වාර්තා මගින් පෙන්නුම් කලේ ය. ගාලු ඓතිහාසික කොටු පවුර ප්‍රදේශයේ බොහෝ තැන් විනාශ වී ගොසිනි. මීටර් 7ක් පමන උස ජල කඳක් නගරයට කඩා වැදුන බව මාතර වැසියෙකු *ලක්බිම* පුවත්පතට පැවසී ය. කලපුවලින් ගහන පලල් තැනිතලා වෙරලේ පහත් බිමක් වන මෙම ප්‍රදේශය සුනාමි ගමන් මාවතේ ම පිහිටියේ ය. ප්‍රදේශයේ මරන සහ විනාශය පිලිබඳව කිසිදු විධිමත් ගනන් බැලීමක් මෙතෙක් සිදු කර නොමැත. සාමාන්‍ය තත්වයන් යටතේ දී පවා මෙම පලාත සමග සංනිවේදනය දුෂ්කර ය. දැන් එය මුලුමනින්ම බිඳවැටී තිබේ.

ගාල්ල සහ කොලඹ අතර හානියට පත් ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම නිරිත දිග වෙරල තීරයේ සුලු නගර සහ ධීවර ගම්මාන සියල්ලගේම නම් පේලියට කියාගෙන යාමක් සේ දිස්වුනි. මෙම දෙනුවර අතර දුම්රිය මාර්ගයේ වැඩිමනත් කොටස වැටී තිබෙන්නේ මුහුද අසලින් වන අතර එය සුවිසල් මුහුදට ගසාගෙන ගොසිනි. මුහුදු මට්ටමෙන් පහල පිහිටි අම්බලන්ගොඩ සහ ගාල්ල අතර මාර්ග කොටසට වැඩිම හානිය සිදුවී ඇත. දහසක් පමන වූ මගීන් ප්‍රවාහනය කරමින් තිබූ දුම්රියක් දැවැන්ත රල පහරට හසුව දෙකට කැඩී ගසාගෙන ගොස් ය.

උතුරේ වේවා, නැගෙනහිර වේවා, නැතහොත් දකුනේ වේවා, විපතට පත් බහුතරය දුප්පතුන් ය. සියවස් ගනනාවක් තිස්සේ ම වෙරල තීරය ලෑලි සහ ටකරන්වලින් ආවරනයක් කර අටවා ගත් පැල්පත්වලින් ගහනව තිබේ. එවන් නිවහන් දැවැන්ත උදම් රැලකදී නොව දැඩි සුලඟකදී වත් ප්‍රමානවත් රැකවරනයක් නො සපයයි.

උදම් රල ගසද්දී මුහුදේ කුඩා ධීවර යාත්‍රා සිය ගනනක් තිබුනි. සිදුවීමට ආසන්නව තිබූ ව්‍යසනය ගැන කිසිදු ඇඟවීමක් නොවී ය. අහස නිසලව පැහැදිලි නීල වර්නයෙන් යුක්ත වූ අතර ගොඩ සුලං හැමී ය. ධීවරයන්ගේ පැත්තෙන් මේ මසුන් මැරීමට අනගි කාලගුනයකි. එදින නත්තලට පසු දා වූයේ නැත්නම් මීට වඩා බොහෝ දෙන මුහුදු යාමට ඉඩ තිබුනි. දින දෙකක විවේකයක් ගැනීමට ඉස්පාසුවක් නැති අන්ත දුගීහු පමනක් මසුන් මැරීමේ නිරත වූහ.

නිසැකවම වැඩිම හානියට ලක් නොවූ උතුරු කොලඹට ආසන්නතම වෙරල තීරයේ ඇති වූ විනාශය අනෙක් තැන්වල සිදුවීමට ඉඩ ඇති විනාශය පිලිබඳව ඇඟවීමක් කරයි. කිලෝමීටර 3ක් දුර ප්‍රමානයක් ඇති කොලඹ වරායේ සිට කැලනි ගඟේ මෝදර දක්වා

පෙදෙසේ පැල්පත්වලින් බොහොමයක් ම හදිසි ජල කඳින් විනාශ වී ගොසිනි. බොහොමයක් ධීවරයන් ඉතා දුප්පත් ය. සිමෙන්තියෙන් නිම කල නිවාස හිමි අතලොස්ස මැද පෙරදිග පීඩා කාරී කොන්දේසි යටතේ ගෘහ සේවිකාවන් සේ සේවය කරන පවුල් සාමාජිකාවන් ගෙන් ලැබෙන මුදල් මත යැපෙති.

ලෝසවෙඅ නියෝජිතයෝ කොලඹට මඳක් උතුරින් පිහිටි මෝදර නම් ධීවර ගමට ගියහ. ශාන්ත ජේම්ස් පල්ලිය, ශාන්ති නිවාස් නේවාසිකාගාරය, ශාන්ත ජෝසප් පල්ලිය සහ විස්වයික් උද්‍යානය ඇතුලු විවිධ ස්ථානවල පවුල් 300ක් පමන තාවකාලික රක්ෂාවරනය ලබා සිටිති.

සුනාමි කඩා වැදුන විට සිදුවූ දේ ආර්. තනපාක්‍යම් මෙසේ විස්තර කලා ය. ''මම දැක්ක රැල්ල අඩි 10ක් නගිනව. අපේ පවුල් 40ම දිව්වා. අපිට ඇඳිවත හැර වෙන කිසිවක් ගන්න බැරි උනා. ඇය සන්තකයේ වූ රුපියල් ලක්ෂයක් (ඇමරිකානු ඩොලර් 1000ක්) ඉක්මවන සියල්ල සේදී ගියේ ය.

''අපිට අනතුරු අඟවා තිබුනේ නැහැ. එසේ වූවා නම් තරමක් හෝ දේ බේරා ගත හැකිව තිබුනි. අපට රජයෙන් හෝ කොලඹ නගර සභාවෙන් කිසිවක් ලැබුනෙ නැහැ. මෙහි, බොහෝ දෙනා ඡන්දය දුන්නේ කලින් ආන්ඩුව කරපු යූඇන්පියට (එක්සත් ජාතික පක්ෂයට). ඒ පක්ෂයේ දේශපාලකයො ටික දෙනෙක් අපිව බලන්න ආව. මොකුත් දුන්නෙ නැහැ. අපට මොනව වුනාද බලන්න මේ ආන්ඩුවේ කව්රුවත් ආවේ නැහැ.''තනපාක්‍යම් පැවසී ය.

වාර්තාවන් ගනනාවකටම අනුව සුනාමිය ශ්‍රී ලංකාවේ වෙරලට කඩා වැදී ඇත්තේ උදේ 9.30ට පමන ය. ඒ උතුරු සුමාත්‍රාව අසල සිදු වූ අති විශාල භූමි කම්පනයකින් උද්භවය ලබා පැය තුන හමාරකට පමන පසුව ය. කෙසේ නමුත් කිසිදු අනතුරු ඇඟවීමක් කෙරී තිබුනේ නැත.

නියමිත උපකරන සහ පහසුකම් තිබුනේ නම් රට පුරාවට ම කල් ඇතිව අනතුරු ඇඟවීමක් කල හැකිව තිබින යයි පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ භූ ගර්භ විද්‍යා මහාචාර්ය කපිල දිසානායක ලොසවෙඅ යට පැවසී ය. තිබෙන සීමිත උපකරන අලුත්වැඩියාවට පවා සරිලන මුදලක් වෙන් කිරීමට ආන්ඩුව අපොහොසත් වී යයි ඔහු පැවසී ය.

උදම් රල ඇතිකල බිහිසුනු විනාශය මධ්‍යයේ පෙර අනතුරු ඇඟවීම් පද්ධතියක් නොතිබීම පිලිබඳ කාරනාව ක්ෂනිකවම සංවේදී දේශපාලන ප්‍රශ්නයක් බවට පත්වෙමින් තිබේ. එක්සත් ජනපදයේ ඒබීසී ජාලය ඉරිදා නිකුත් කල වාර්තාවක මෙසේ සටහන් විය:

''ශ්‍රී ලංකාව මරනීය දල රල පිලිබඳව වෙරලවාසී ජනයාට අනතුරු ඇඟවීමට සැලසුම් ගත කල ජාත්‍යන්තර සංනිවේදන පද්ධතියට සම්බන්ධ වී සිටියේ නම් මේ සා විශාල සමාජ ව්‍යසනය පිටුදැකිය හැකිව තිබුනි.''

එහෙත් ජනාධිපතිනී චන්ද්‍රිකා කුමාරතුංග යටතේ ක්‍රියාත්මක වන මානව ආපදා කලමනාකාර කමිටුව කිසිදු වගකීමක් භාර ගැනීම ප්‍රතික්ෂේප කලේ ය. එහි ප්‍රකාශිකාවක ලොසවෙ අඩවියට ප්‍රකාශ කලේ: ''ආපදා කලමනා කරනය ආපදා වැලැක්වීම පිලිබඳව සැලකිලිමත් නො වේ. ඒ වෙනුවට එය සැලකිලිමත් වන්නේ හානියට ප්‍රතිකර්ම යෙදීමට සහ ලබා ගත හැකි කවර හෝ ආධාරයක් බෙදා හැරීමට ය.''

තවත් නිල මඬුල්ලක් වන ආපදා තොරතුරු මධ්‍යස්ථානය කිසිදු ප්‍රකාශයක් නොකල අතර ඒ හැටි ලොකු තොරතුරක් සැපයීමට හැකියාවක් ද ඔවුනට නො වීය. ''අපි දන්නේ දහස් ගනනක් මැරුන බව විතරයි.'' යනුවෙන් එහි නියෝජිතයෙකු පැවසී ය.

අගමැති මහින්ද රාජපක්ෂගේ ලේකම් ලලිත් වීරතුංග ප්‍රන්ස පුවත් සේවයට මෙසේ පාපොච්චාරනය කලේ යː ''අපි අලසව සිටියා. පොඩි කැලඹීමක් දැනුනාම මිනිස්සු භූමි කම්පා සහ උදම් රැලි ගැන අනාවැකි කියනවා. ඒත් පැහැදිලිවම අප අනතුරු ඇඟවීම් බැරෑරුම්ව භාර ගත්තේ නැහැ.''

ටග් යාත්‍රාවක නියාමකයෙකු සහ කොලඹ වරායේ නියාමක කාර්යාංශය අතර සිදු කැරුන බවට ලෝසවෙ අඩවියට වාර්තා වූ එක් සංවාදයක් සුනාමි රල වැදීමට ආසන්නයේ දී පැවැති අන්ත වික්ෂිප්ත භාවය පිලිබඳව ආලෝකයක් විහිදුවයි. ජලයේ පැවැති අසාමාන්‍ය චලිත සහ අද්භූත පෙන දැකීමෙන් අනතුරුව මෙම නියාමකයා සිදුවන්නට යන දේ ගැන යම් ආරංචියක් තිබේදැයි විමසුවේ ය. ඔහු ලද පිලිතුර වූයේ: ''මොකක් හරි වෙන්න යනව කියල කට කතාවක් තියෙනව. ඒත් මට ස්ථිරව කියන්න බැහැ.''

සියවස් ගනනාවක් තුල රටට ඇතිවූ විශාලතම ව්‍යසනය හමුවේ සමස්ත දේශපාලන සංස්ථාපිතයම මේ බිහිසුනු තත්වයෙන් ගොඩ ඒම සඳහා එක්සත් වන්නැයි ආයාචනා කරයි. ආධාර සඳහා විවිධ ආයාචනා කර තිබේ. ශෝක පනිවිඩ නිකුත්කර තිබේ. එහෙත් මේ සියල්ල වර්තමාන හා අතීත ආන්ඩුවල නොසැලකිල්ල වසා ගැනීමට සහ සැපයෙන සීමිත උපකාර සහ සහන පිලිබඳව වැඩෙන කෝපය වෙනතක හැරවීමට ය.

වැඩකරන ජනයාගේ ප්‍රතිචාරය පාලක කව වල නරුම ප්‍රතිචාරයට මුලුමනින් ම ප්‍රතිවාරුද්ධව පිහිටයි. ක්ෂනිකවම පැන නැගුන ස්වෙච්චා සංවිධාන විසින් සියලුම ප්‍රදේශවලින් ටොන් ගනන් ආහාර බේත්හේත් හා ඇඳුම් පැලඳුම් දැනටමත් එක් රැස් කර තිබේ. කොලඹ ප්‍රධාන මාවත්වලට අවතීර්න වූ සරසවි සිසුහු වාහන නවතමින් ආධාර එකතු කරති. සියල්ලටමත් වඩා දෙමල, සිංහල, මුස්ලිම් සියල්ලට ම එක සේ සහන බෙදා දෙනු ලැබේ. පාලක ප්‍රභුවන් විසින් දශක ගනනාවක් තිස්සේ වර්ගවාදී ආතතීන් උසිගැන්වූ රටක මෙය ඉතා වැදගත් වර්ධනයකි.

© www.wsws.org